# (47) සිංහල සාහිත්‍ය රසාස්වාදය

## ප්‍රශ්න පත්‍ර ව්‍යුහය

ප්‍රශ්න පත්‍රය කොටස් 3කින් සමන්විත වේ. කාලය පැය 03යි. මුළු ලකුණු 100කි.

I කොටස - අනිවාර්ය ප්‍රශ්න 2කි. මුළු ලකුණු 45කි.
**පළමුවන ප්‍රශ්නය නිර්දිෂ්ට ගද්‍ය/පද්‍ය කොටස් ඇසුරෙන්** සකස් කෙරෙන අතර අනුකොටස් 2කින් යුත් කොටස් 5 කින් සමන්විත වේ.එක් අනුකොටසකට ලකුණු 2 බැගින් මුළු ලකුණු 20කි. **දෙවන ප්‍රශ්නය නිර්දිෂ්ට පද්‍ය පන්තියක් පිළිබඳ රසාස්වාදයක්** සැපයීමට අදාළ ප්‍රශ්නයකි. **අවම වචන සංඛ්‍යාව 200කි.** ලකුණු 25කි.

II කොටස - තෙවන ප්‍රශ්නය අනිවාර්ය වේ.අවබෝධය හා සාහිත්‍ය දැනුමට අදාළ ව්‍යුහගත ප්‍රශ්නයක් වන මෙය ගද්‍ය/පද්‍ය **ලෙස විකල්ප ප්‍රශ්න 2කින් සමන්විත වේ. ඉන් එකකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය.** ලකුණු 25කි.

III කොටස - 4, 5, 6, 7 රචනාමය ප්‍රශ්න වන අතර ඉන් ප්‍රශ්න 2කට පමණක් පිළිතුරු සැපයිය යුතු ය. **පිළිතුරකට අවම වශයෙන් වචන 150ක්වත් තිබිය යුතු ය.** එක් ප්‍රශ්නයකට ලකුණු 15 බැගින් මුළු ලකුණු 30කි.

**සැලකිය යුතුයි :**

* **I** කොටසෙහි 1 ,2 ප්‍රශ්නවලටත් , **II** කොටසෙහි 3 වැනි ප්‍රශ්නයටත්, **III** කොටසෙහි 4,5,6,7 ප්‍රශ්නවලින් තෝරා ගත් ප්‍රශ්න **දෙකකටත්** උත්තර සපයන්න.

---

## I කොටස

**1.** (i) සිට (v) තෙක් ඇති කොටස් කියවා ඒවා ඇසුරෙන් අසා ඇති (අ), (ආ) ප්‍රශ්නවලට **කෙටි උත්තර** ලියන්න.

(i) "දේවයන් වහන්ස බිසවුන් වහන්සේ තනි ව වැඩ සිටි සෙයින් වැද්ද නොහෙමි"
(අ) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?
(ආ) මෙහි **බිසවුන් වහන්සේ** යනුවෙන් හැඳින්වූයේ කවුරුන් ද?

(ii) "ගියත් **සුළුගෙයි** වහා එව"
(අ) මෙහි **සුළුගෙයි** යනුවෙන් ඇමතුණු අයගේ නම ලියන්න.
(ආ) මෙම පාඨය ඇතුළත් මුල් කෘතිය නම් කරන්න.

(iii) "ඩිංගිගෙන් බත් ඉල්ලා ගෙන කාල නිදා ගන්න"
(අ) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?
(ආ) ප්‍රකාශය ශ්‍රවණය කළ තැනැත්තා අනතුරු ව කුමක් කළේ ද?

(iv)
රුදුරු ගිනි කඳක් ගත් සඳෙහි වන'තුරු
මිතුරු වේය දිගතින් හමන මඳ මරු
**මිතුරු** නැසීමට එම වෙයි පසමිතුරු
**මිතුරු** නැකෙනෙක් නිවතුන් හට කවුරු

(අ) මෙහි මුල් කවි පද දෙකේ අදහස ලියන්න.
(ආ) තද කළු අකුරෙන් මුද්‍රිත පදවල අර්ථ වෙන වෙන ම ලියන්න.

(v) පිරුණු ලොරිය ගම් දොරකඩ පියමං කර යනවා
පාර වුණත් හිරිහැරයක් නෑ ඔහෙ නිදියනවා
පැලේ වහල ඇද හැලිලා මාසයක් ම වෙනවා
පරාල තුනකට අයියා හිරේ හුහුං ලනවා

(අ) **පාර වුණත් හිරිහැරයක් නෑ ඔහෙ නිදියනවා** යන්නෙන් මතු කෙරෙන අර්ථය කුමක් ද?
(ආ) මෙම කවිය ඇතුළත් පැදි පෙළේ රචකයා කවරෙක් ද ?

(ලකුණු 04 x 05 =20යි)

**2.** පහත දී ඇති පැදි පෙළ කියවා අසා ඇති ප්‍රශ්න උපයෝගි කොට ගෙන රසාස්වාදයක් ලියන්න.

චිච්රි චිරි චිච්රි චිරි උදේ සිට ඇද හැලෙන
පොද නො කැඩී තෙත බරිව හිරිකිතෙන් කිලිපොළන
පාර තොට, ගහ කොළ ද, වසා ගෙන හැම අතින
වහින වැහි වහින වැහි නො පායන මුළු දවස

ගොහොරු මඩ ඇඟිලි කරු අතර චිරි චිරි ගාන
මඩ කඩිති හැම තැන ම මඩ පාට දිය රැඳුණ
අලුත් පස් දැමූ පාර දණිහ තෙක් මඩ එරෙන
බැනියම ද ඇඟට ඇලි උදේ සිට තෙත බරිව

තෙමුණ රෙදි ඇඟ ඇලුණ හබුරු කොළ මලිපිටි ද
දෝර ගොස් හැම තැන ම වක්කලන් ඇලි හැදුණ
හැට්ට අත් කඳ කලව තෙත රෙද්ද ඇඟ එතුව
වහින වැහි තද හුළඟ නො පායන මුළු දවස

ඔළුව කෙස් තෙත බරිව පිට දිගේ වැක්කෙරෙන
කාර් රෝදෙන් චිරිස් ඇඟ පුරා මඩ ඉහෙන
ආයිමත් හිටි ගමන් තද කරන් එන සැණින
වහින වැහි වහින වැහි නො පායන මුළු දවස

ගෙදර ගොස් ඇඳපු දේ මොහොතකින් ඉවර කොට
තුවායෙන් ඇඟ පත ද පිහ දමා හිස කෙස් ද
අලුත් සරමක් ඇඳන් උණට උණු තේ වතුර
ඇඳෙහි ඉඳ උණුහුමට බොන්නෙ කොයි මොහොතෙ ද යි
වැහි පොදෙහි පෙඟුණ සිත හිත හිතා ලත වේ ය

(ලකුණු 25යි)

(i) සජීවී ආකාරයෙන් වැස්ස නිරූපණය කිරීම සඳහා කවියා තෝරා ගත් විවිධ දර්ශන මොනවා ද ?

(ii) කවියා තෝරා ගත් විවිධ දර්ශන ඉදිරිපත් කළ අනුපිළිවෙළ රස නිෂ්පත්තිය උදෙසා කොතරම් උචිත වූවක් ද?

(iii) මේ කවි පෙළ රචනයේ දී මධ්‍යම පාන්තික සමාජය කෙරෙහි කවියාගේ විශේෂ අවධානය යොමු වී ඇති ආකාරය පැහැදිලි කරන්න.

(iv) මෙහි යොදා ඇති ශබ්ද ධ්වනි කවියාගේ අභිමතාර්ථ සපුරාලීමට කෙතෙක් දුරට සමත් වී ඇත් ද?

(v) කවියා යොදා ගත් ආකෘතිය රස නිෂ්පත්තිය උදෙසා උචිත වූවක් ද?

## II කොටස

**3.** පහත දැක්වෙන ගද්‍ය-පද්‍ය කොටස් දෙකින් **එක කොටසකට පමණක්** උත්තර සපයන්න.

ඉක්බිති රජ්ජුරුවෝ බිසවුන් ගිවිස්වමින් "දේවීනි, ප්‍රභාවතීන් කපා නො දී අනික් කුමක් කරවු ද, තොපගේ දියණියෝ සියලු දඹදිවට අග්‍ර රජ්ජුරුවන් විරූපයයි හැරපියා ගිය මග එම පිය නොමැකෙන තෙක් මරණ නළල තිබා ගෙන අවුය. දැන් තමාගේ රූ නිසා කරන ලද ඊර්ෂ්‍යාවෙහි විපාක ලබන්නී වේ දැ" යි කීහ.

එබස් අසා බිසෝ දියණියන් ළඟට ගොස් අඬමින් වලපමින් "දියණියෙනි, තොපට අමනාපයක් සිතිනුත් නොසිතන්නා වූ මාගේ බස් නොගිවිස තොප දැන් ලේ පෙර පෙරා සත්කඩක් කොට කපා මේ රජදරුවන්ට දෙන ලදුව යමපුරයට යන්නී වේ ද. තව ද මේ ලෝකයෙහි යම් සත්වයෙක් වැඩෙහි හැසිරෙන හිතේෂීන්ගේ කීම නොකරන්නේ ද එතෙම මෙබඳු වූ දුක්කම්කටුළු ලදුව නොයෙක් අනය ව්‍යසනයට ද පැමිණෙන්නේ ය. තව ද රන් කමින් උදුල මාණික්‍ය මේඛලාදාමයෙන් විරාජමාන වූ ප්‍රභාවතීනි, ඉදින් තමාගේ සිත් පස්සේ නොගොස්, උභය කුල පරිශුද්ධ අසම්භින්න සූර්යවංශප්‍රසූත ශෞර්‍යවීර්‍යවික්‍රම සමන්විත කුසරජ්ජුරුවන් හා එක් ව තොප හා සමාන රූපශ්‍රීන් ඇති දැකුම් කටයුතු වූ කුමාර කෙනෙකුන් ලද හොත් අප ඇම ඇතුළු වූ බොහෝ ඥාතිවර්ගයා විසින් සත්කාර සම්භාවනා කරන ලදුව සියලු දුක් දුරුකොට බොහෝ දවසක් සැප සේ වාසය කරන්නී වේ ද"

(i) මෙම උද්ධෘතය ඇසුරෙන් පබවතියගේ කෙබඳු චරිත ලක්ෂණ ඉස්මතු වේ ද?. (ලකුණු 05 යි)

(ii) කුස ජාතක කතාකරු අපූර්වත්වයෙන් යුතු ව භාෂාව හසුරුවා ඇති බවට නිදසුන් දෙකක් ඉදිරිපත් කරන්න. (ලකුණු 05 යි)

(iii) රාජ්‍ය පාලනයේ දී රජතුමා කටයුතු කළ ආකාරය මෙම පාඨය ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) තම දියණිය මුහුණ දෙන අවාසනාවන්ත සිදුවීම් හමුවේ සංවේගයට පත්වන මවකගේ ස්වරූපය කතුවරයා නිරූපණය කොට ඇති අයුරු උද්ධෘත කොටස ඇසුරෙන් විමසන්න. (ලකුණු 10 යි)

නැතහොත්

පෙරදිග ගොරහැඩි රකුසෝ,
මගෙ ධ්‍යානය ඇයි කඩන්නේ
නිදා ගන්න පොරොව ගත්ත
කළු රෙදි පොට
මොකට ද මේ
තීරුවලට ඉරා දමන්නෙ

කුරුල්ලන්ට ගල් ගහලා
උන් හොඳට ම බිය කරලා
මල් පොහොට්ටු තිගැස්සිලා
කඳුළු හෙලනවා

ඇස් දෙක මම අරින්නෙ නෑ
තුරුලු කරන් භාවනාව
නැවතත් යන්නට යනවා
මම
මගේ දැහැන ලෝකයට ම

(i) හිරු උදාව කවියාගේ උදහසට ලක් වී ඇති ආකාරය දැක්වෙන නිදසුන් දෙකක් ඉදිරිපත් කරන්න. (ලකුණු 05 යි)

(ii) කවියා තම අත්දැකීම් පරිකල්පනය කිරීම සඳහා යොදා ගෙන ඇත්තේ සරල බස් වහරකි. කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iii) කවිපෙළේ සාර්ථකභාවය රැක ගැනීම සඳහා කවියා යොදා ගෙන ඇති කාව්‍යෝක්ති කවරේ ද? (ලකුණු 05 යි)

(iv) ස්වාභාවික සිදුවීමක් අපූර්වාකාරයෙන් ඉදිරිපත් කිරීමට කවියා දක්වා ඇති කුසලතාව මෙම කවිපෙළ ඇසුරෙන් විමසන්න. (ලකුණු 10 යි)

(ලකුණු 25 යි)

## III කොටස

මෙම කොටසේ ප්‍රශ්න **දෙකකට** පමණක් උත්තර සපයන්න.
(එක් උත්තරයක් වචන **150ක්වත්** තිබිය යුතු ය.)

4. පොදු ජනතාවට යෝග්‍ය ආකාරයෙන් උපදේශ ඉදිරිපත් කිරීමේ දී සුභාෂිතය කවියා භාවිත කළ කාව්‍යෝපක්‍රම කවරේ දැ යි නිදසුන් **තුනක්වත්** දක්වමින් විමසන්න. (ලකුණු 15 යි)

5. විරූපී භාවය නිසා පසුතැවිල්ලට පත් වූ පුද්ගලයෙකුගේ ලක්ෂණ කුස චරිතයෙන් නිරූපණය කෙරෙයි. කුස ජාතක කථාවෙන් නිදසුන් **තුනක්වත්** දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 15 යි)

6. පොදු ජනතාවගේ මනෝභාවයන් අව්‍යාජත්වයෙන් යුතු ව නිරූපණය කිරීමෙහි ලා ජන කවියා දක්වන දක්ෂතාව අභිමත නිදසුන් **තුනක්වත්** ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 15 යි)

7. ගැමියන්ගේ චර්යා හා සිතුම් පැතුම් සිත් ගන්නා අයුරින් ඉදිරිපත් කිරීම සඳහා තුංමංහන්දිය කතුවරයා දැරූ ප්‍රයත්නය කොතෙක් දුරට සාර්ථක වී දැ යි අභිමත චරිතයක් ආශ්‍රයෙන් නිදසුන් **තුනක්වත්** දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 15 යි)

(ලකුණු 15x2 =30යි)

* * *